## 10 - ශ්‍රී ලංකා ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

1.ගෙවුම් තුලිත ලේඛනයේ නව ආකෘතියට අනුව ප්‍රධාන ගිණුමක් වන්නේ,

1.භාණ්ඩ ගිණුම
2. සේවා ගිණුම
3.ජංගම ගිණුම
4.වෙළෙඳ ගිණුම
5.ප්‍රාථමික ආදායම් ගිණුම

2. මූල්‍ය ගිණුමේ ඇතුළත් කෙරෙන අයිතමයක් ලෙස නොසැලකිය හැක්කේ,

1. සෘජු ආයෝජන
2. මූල්‍ය ව්‍යුත්පන්න
3. කළඹ හා වෙනත් ආයෝජන
4. සංචිත වත්කම්
5. සංචිත වගකීම්

3.ගෙවුම් ශේෂයේ හටගන්නා හිඟයක් මූල්‍යයනය කළ හැකි මාර්ගයක් නොවන්නේ,

1. විදේශ සංචිත වත්කම් යොදා ගැනීම.
2. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සම්පස්ථා ණය ලබා ගැනීම.
3. අපනයන විවිධාංගීකරණය
4. මහ බැංකු අත්තිකාරම් ලබා ගැනීම.
5. අත්‍යවශ්‍ය ආනයන හැර අවශේෂ ආනයන අධෛර්යවත් කිරීම.

4.විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් උපයා මෙරටට කරනු ලබන පෞද්ගලික ප්‍රේෂණ,

1. ප්‍රාථමික ආදායමකි.
2. ද්විතීයික ආදායමකි.
3. සාධක ආදායමකි.
4. අපනයන ආදායමකි.
5. සේවා ආදායමකි.

5.කිසියම් වර්ෂයක් අවසානයේදී රටක් බාහිර ලෝකය සමඟ කරනු ලබන ශුද්ධ ගනුදෙනුවල ප්‍රතිඵලය ලෙස ශුද්ධ ණයහිමියෙක් වේ නම් ඉන් අදහස් වන්නේ,

1. ගෙවුම් ශේෂයේ හිඟයක් පවතී.

2. ගෙවුම් ශේෂයේ අතිරික්තයක් පවතී.
3. ජංගම ගිණුමේ ශේෂය මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන වේ.
4. ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන වේ.
5. ශුද්ධ වැරදි හා අත්හැරීම් ශූන්‍ය වේ.

6.විදේශ සම්පත් පරතරය හිඟ වූ විට ආර්ථිකය වෙත බලපාන ප්‍රතිවිපාකයක් නොවන්නේ,

1. මුදලේ විදේශ අගය ඉහළ යාම.
2. මුදලේ විදේශ අගය පහළ යාම.
3. විදේශ ණය ගැනීමට සිදුවීම.
4. මුදල් සැපයුම පහත වැටීම.
5. විදේශ වත්කම් ප්‍රමාණය පහළ යාම.

7.විනිමය අනුපාතිකයේ අධි තක්සේරු වීමක් හඳුනාගත හැකි අවස්ථාවකි,

1. විනිමය අනුපාතය වෙළෙඳපල මගින් තීරණය වීමට ඉඩ හැරීම.
2. වෙළෙඳ ගිණුමේ අඛණ්ඩ හිඟයක් පැවතීම.
3. සේවා ගිණුමේ විශේෂ අතිරික්තයක් බිහිවීම.
4. ශුද්ධ ආදායම් ධන අගයක් ගැනීම.
5. මුදලේ බාහිර අගය පහළ වැටීම.

8.අනෙකුත් කරුණු නොවෙනස්ව පවතින විට නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ ආනයනය සඳහා ඇති ඉල්ලුම ඉහළ යාමක් නිසා සිදු වේ යැයි අපේක්ෂා කළ හැක්කේ,

1. විදේශ මුදලකට ගෙවිය යුතු දේශීය මුදල් ප්‍රමාණය අඩු වීම.
2. විදේශ මුදල් ඒකකයේ දේශීය මුදල් වටිනාකම ඉහළ යාම.
3. විදේශයන්ගෙන් සැපයෙන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ යාම.
4. දේශීය මුදල් ඒකකයේ විදේශීය අගය ඉහළ යාම.
5. දේශීය මුදල් ඒකකයේ අගය ස්ථාවරව තිබියදී විදේශ මුදල් ඒකකයේ අගය අඩුවීම.

9. ශ්‍රී ලංකාව වැනි ආර්ථිකයන්හි ආයෝජනය සඳහා සම්පත් සම්පාදනයේදී දේශීය ඉතුරුම් ප්‍රමාණවත් නොවීම නිසා විදේශ ඉතුරුම් ලබා ගැනීමට සිදු වේ.එසේ විදේශීය ඉතුරුම් ලබා ගත හැකි මාර්ගයක් නොවන්නේ,

1. විදේශ ණය
2. අපනයන ආදායම
3. විදේශ පරිත්‍යාග
4. විදේශ සෘජු ආයෝජන
5. විදේශ කළඹ ආයෝජන

10. ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක අවාසියක් ලෙස සැලකිය හැක්කේ,

1. ආයෝජන අධෛර්යමත් වීම.
2. උද්ධමනය පීඩනය ඉහළ යාම.
3. අවිනිශ්විතතා බිහිවීම.
4. සම්ප්‍රේක්ෂණය ඉහළ යාම.
5. විශාල විදේශ විනිමය සංචිතයක් තබා ගැනීමට සිදුවීම.

**<u>පිළිතුරු</u>**

| | |
|---|---|
| 1.) 3 | 6.) 1 |
| 2.) 5 | 7.) 2 |
| 3.) 4 | 8.) 2 |
| 4.) 2 | 9.) 2 |
| 5.) 2 | 10.) 5 |

**<u>සකස් කළේ -</u>**

**එච්.එම්.එන්.සී.හේරත් මිය,**
**ර/විද්‍යාරාජ විද්‍යාලය**